51

සුබ නිමිති ප්‍රකාශනයෙහි ලා හංස සන්දේශයේ අනන්‍යතාව

ලක්මාලි, ඩබ්. ජී. එස්.[1]

සිංහල සන්දේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වන්නේ කෝට්ටේ යුගයයි. මේ යුගයේ විරචිත සන්දේශ ලෙස පරෙවි, සැළලිහිණි, කෝකිල, ගිරා සහ හංස යන සන්දේශ පංචකය හඳුනාගත හැකි ය. මේ යුගයේ දී සුබ නිමිති පිළිබඳ විශ්වාසය මෙරට ජනතාව කෙරෙහි තදින් බලපෑ බව මෙම සන්දේශ පිළිබඳ ව විමර්ශනාක්ෂිය යොමු කිරීමේ දී දෘශ්‍යමාන වේ. නමුත් වීදාගම මහමෙත් තෙරිඳුන් විසින් විරචිත හංස සන්දේශයෙහි සුබ නිමිති කෙරෙහි අවධානය යොමු නොකරන්නේ යැයි ඇතැම් විද්වතුන් දරන මතය පිළිබඳ ව විමර්ශනය කිරීම මෙහි අරමුණ වේ. යථෝක්ත සන්දේශයන්හි සංස්කරණ හා එම සන්දේශ පිළිබඳ ව ලියැවුණු විචාර, විමර්ශන ඇසුරු කර ගනිමින් මෙම විමර්ශනය සිදු කෙරේ. තත්කාලීන අනෙකුත් සන්දේශයන්හි දූතයා පිටත්කර හැරීමේ දී දෘෂ්ටි ගෝචර සුබ නිමිති දැකගන්නා ලෙස උපදෙස් ලබාදෙයි. එසේ ම හංස සන්දේශයෙහි ද ශ්‍රව්‍ය ගෝචර සුබ නිමිත්තක් ලෙස පිරිත් ශ්‍රවණය කර තම දූත ගමන පිටත්වන ලෙස හංසයාට උපදෙස් සපයන අයුරු විද්‍යමාන වේ. හංසය බෞද්ධ මුහුණුවරක් ගත්ත ද දේව විශ්වාසය හා සුබ නිමිති පිළිබඳ විශ්වාසය ප්‍රතික්ෂේප නොකරයි. අරණ්‍යවාසී යති පරපුරෙන් පැවත එන හංස සන්දේශ කතුවරයා ග්‍රාමවාසී යති පරපුර හා ගැටෙන අයුරු හංස ගිරා ගැටුම තුළින් විද්‍යමාන වේ. තත්කාලීන අනෙකුත් සන්දේශකරුවන් මෙන් ම ගිරා සන්දේශකරුවා ද දූතයා පිටත්කර හැරීමේ දී දෘෂ්ටි ගෝචර සුබ නිමිති දක්නට උපදෙස් ලබාදෙන අතර ගිරාවට පිළිතුරක් ලෙස ලියැවෙන හංස සන්දේශයෙහි ශ්‍රව්‍ය ගෝචර සුබ නිමිත්තක් ලෙස පිරිත් ශ්‍රවණය කිරීම යොදාගෙන ඇති බව පැහැදිලි ව ම පෙනේ. මේ අනුව සුබ නිමිති මිථ්‍යාවන් ලෙසටත්, හංස සන්දේශයෙහි සුබ නිමිති පිළිබඳ සංකල්ප ඇතුළත් නොවන බවටත් ඇතැම් විද්වතුන් විසින් දරන ලද මතය හේතු සාධක සහිත ව ඛණ්ඩනය වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ සුබ නිමිති, හංස සන්දේශය, ගිරා සන්දේශය, පිරිත්, අරණ්‍යවාසී

1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර, සිංහල අධ්‍යයනාංශය.